අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/01/19/06/01/2026(Scl

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.10. 13

සියලුම පීඨාධිපතිවරුන් / විදුහල්පතිවරුන් වෙත,

**2026 වාර්ෂික ස්ථාන මාරුවීම් - ඒකාබද්ධ සේවය**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/TRANS/V/වා.ස්.මා./2026 හා 2025.10.01 දිනැති ස්ථාන මාරු නියෝගය හා බැදේ.

02. ඒ අනුව මේ සමඟ අමුණා ඇති ලේඛනවල සඳහන් පරිදි ඔබ විද්‍යාපීඨයේ/ විද්‍යාලයේ සේවය කරන ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් ඇති අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය වෙත ස්ථාන මාරු කර ඇත. එම ස්ථාන මාරුවීම් 2026.01.01 දින සිට හෝ නිලධරයන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින වලදී ක්‍රියාත්මක වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව/ මැතිවරණ කොමිෂන් සභාව යන ස්ථාන වලට ස්ථාන මාරු කරන ලද නිලධරයන්ගේ ස්ථාන මාරු අදාළ ආයතන ප්‍රධානීන්ගේ එකඟත්වයට යටත්ව ක්‍රියාත්මක වන බව දන්වා ඇත.

03. ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ හැකි වන පරිදි මෙම අමාත්‍යාංශය යටතේ සේවයෙන් මුදා හැරීමට කටයුතු සිදුකළ යුතු අතර මට ද පිටපතක් සහිතව මුදාහැරීමේ ලිපියක් නිකුත් කළ යුතුය. තව ද ස්ථාන මාරුවී යාමට ප්‍රථම එම නිලධාරීන් භාරයේ පවතින රජය සතු ලිපි ලේඛන හා බඩුභාහිරාදිය විධිමත් පරිදි භාරගත යුතුය. එසේම ස්ථාන මාරුවී ඔබ විද්‍යාපීඨයේ/ විද්‍යාලයේ සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ රාජකාරි භාරගත් ලිපියෙහිද පිටපතක් මා වෙත යොමු කළ යුතුය.

04. අමාත්‍යාංශයන්හි විෂය පථය වෙනස්වීම මත ඇතැම් නිලධාරීන්ගේ සේවා ස්ථානයන්හි වෙනස්කම් සිදුව ඇති බැවින් හා එවැනි සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකු හට 2026 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබා දී ඇත්නම්, එම නිලධාරියා මේ වන විට සේවය කරන සේවා ස්ථානය වෙත ඔහුගේ/ ඇයගේ අනුප්‍රාප්තික නිලධාරියා වාර්තා කළ යුතු බව වැඩිදුරටත් දන්වා ඇත.

05. ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගයේ 06 සහ 07 ඡේදයේ සඳහන් පරිදි අන්තර්ජාලයට පිවිසීමට භාවිතාකරනු ලබන්නේ LGN Wi-Fi ජාලය නම් http://10.250.1.112/misco ඔස්සේ ද, වෙනත් ජාලයක් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සලසා ගන්නේ නම් http://43.224.125.68/misco යන වෙබ් ලිපිනය ඔස්සේ ද මාර්ගගත මෘදුකාංගය (Online Application) තුළට පිවිස තම අභියාචනය 2025.10.15 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර එම අයදුම්පතෙහි දෘඩ පිටපතක් ඔබ විසින් නිර්දේශ කර වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ඩී.බී.පී. ජීවනී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( ඒකාබද්ධ සේවා )
ලේකම් වෙනුවට

පිටපත :- සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary: +94112784811, +94112785162, secretary.education@moe.gov.lk

CamScanner